WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 40 - සංගීතය(පෙරදිග)

ලකුණු දීමේ පටිපාටිය



අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**

**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018**

**40 - සංගීතය (පෙරදිග)**

**ලකුණු දීමේ පටිපාටිය**

I පත්‍රයට - 1 × 40 = 40

II පත්‍රයට - පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුයි .

- එක් ප්‍රශ්නයකට ලකුණු 12 × 05 = 60

- අවසන් ලකුණු සංඛ්‍යාව ලකුණු 100 යි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ............................................................ √ △ $\frac{4}{5}$
............................................................
............................................................

(ii) ............................................................
............................................................ √ △ $\frac{3}{5}$
............................................................

(iii) ............................................................
............................................................ √ △ $\frac{3}{5}$
............................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

WWW.OLEVELAPI.COM

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක් වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියලුම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළ දී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතුය.

WWW.OLEVELAPI.COM

සැ.යු :- **සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතුය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

## 1 වන පත්‍රයේ අභිමතාර්ථ

1) ස්වර සප්තකයේ ප්‍රකෘති / විකෘති ස්වර සංඛ්‍යාව හඳුනා ගනියි.
2) ස්වර සංගති අනුව රාග හඳුනා ගනියි.
3) කාෆි රාගය පිළිබඳ තොරතුරු තෝරයි.
4) බිලාවල් රාගයේ වාදි සංවාදි අනුවාදි ස්වර තෝරයි.
5) තානාලංකාරය අයත් රාගය තෝරා නම් කරයි.
6) මුඛ්‍යාංගයක ස්වරූපය හඳුනා ගනියි.
7) සිතාර් / එස්රාජ් භාණ්ඩ සුසර කිරීමේ ක්‍රම දැන ගනියි.
8) රාගයන්හි යෙදෙන විකෘති ස්වර දැන ගනියි.
9) යමන් රාග අංග අවබෝධයෙන් තානාලංකාර තෝරයි.
10) තාල සංකේත පිළිබඳ අවබෝධය ප්‍රකාශ කරයි.
11) තාල ලක්‍ෂණ පිළිබඳ අවබෝධය ප්‍රකාශ කරයි.
12) ලාවනී / කෙහෙර්වා තාල ලක්‍ෂණ සසඳයි.
13) කාෆි රාගයේ අන්තරා ආරම්භ විධි හඳුනා ගනියි

14) – 17) නිර්දේශිත රාග විස්තර හඳුනා ගනියි.

18)

19) විවිධ සංගීතඥයින්ගේ සුවිශේෂතා හඳුනා ගනියි.
20. රාගානුකූල ස්වර අභ්‍යාස අවබෝධයෙන් ගොඩ නගයි.

21. – 24) රූප සටහනින් දැක්වෙන අවනද්ධ භාණ්ඩයන්හි සුවිශේෂතා හඳුනා ගනියි.

25) අදාළ රාගයට අනුකූල නූර්ති ගීතය තෝරයි.
26) අනාඝාතාත්මක මෙහෙ ගී පාදය තෝරයි.
27) දී ඇති පැදි පාදයට අයත් සඳැස්මත් / ගී මත් ගණනය කරයි.
28) දී ඇති පැදි පාදයට අයත් ගුරු අක්‍ෂර සංඛ්‍යාව තෝරයි.
29) නාඩගම් ගීතය පාදක කර ගත් නව නාට්‍ය ගීතය තෝරයි.
30) දී ඇති කොටස් ඇසුරෙන් වන්නම් සම්ප්‍රදාය හා වන්නම නම් කරයි.

31) – 34) නිර්දේශිත චිත්‍රපට ගී ඇසුරින් නිවැරදි තොරතුරු හඳුනා ගනියි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

35) නාදයේ ගුණ හඳුනා ගනියි.

36) රාගයක ආරෝහණය අපරදිග ස්වර අක්ෂරවලින් ලියා දක්වයි.

37) ස්වර පුවරුවේ බටහිර කෝර්ඩ්ස්වලට අයත් ස්වර හඳුනා ගනියි.

38) ස්වර පුවරුවේ දී ඇති අංකවලට අදාළ ස්වර අක්ෂර තුළින් රාගය නම් කරයි.

39) යතුරු පුවරු මගින් කරනු ලබන නිර්මාණයන්ට භාවිත නාමය හඳුනා ගනියි.

40) පරිගණකය ආශ්‍රිත සංගීත පටිගත කිරීම් පිළිබඳ අවබෝධය ප්‍රකාශ කරයි.

## 11 වන පත්‍රයේ අභිමතාර්ථ

1.

i. සංගති අනුව රාගය තෝරා ජාතිය නම් කරයි.

ii. යමන් රාගයේ යෙදෙන මධ්‍යම ස්වරයේ විශේෂතාව හඳුනා ගනියි.

iii. තාල සංකේත යෙදීමට අනුකූලව, තාල හඳුනා ගනියි.

iv. ඛ්‍යාල් ගායනා සඳහා සුවිශේෂ වූ තාල වාද්‍ය භාණ්ඩය නම් කරයි.

v. නිර්දේශිත චිත්‍රපටයක සංගීත නිර්මාතෘ නම් කරයි.

vi. ගී පාදය අනුව ප්‍රායෝගිකව යෙදෙන තාලය හඳුනා ගනියි.

vii. නිර්දේශිත ගීතයක සංගීත නිර්මාතෘ නම් කරයි.

viii. සංගීතමය නාට්‍යයක එන ජවනිකාවක් පිළිබඳව අවබෝධය ප්‍රකාශ කරයි.

ix.
x. } දී ඇති තොරතුරු ගැළපෙන ලෙස අදාළ ගීත හා සමඟ සම්බන්ධ කරයි.

2.

i. ස්වර සංගති අනුව රාග තෝරා නම් කරයි.

ii. මධ්‍යම ස්වරයේ සුවිශේෂතාව රාග අනුව හඳුන්වයි.

iii. නිර්දේශිත රාගයන්හි ඛ්‍යාල් ගීත, ගත්, වාදිත (ස්ථායි) ස්වර ප්‍රස්තාර කරයි.

WWW.OLEVELAPI.COM

3.

i. A හා B ප්‍රකාශයන්හි තොරතුරු අනුව රාග තුනක් තෝරා නම් කරයි.

ii. බිලාවල්, භූපාලි, යමන් යන රාග අතරින් එක් රාගයකට අදාළව තානාලංකාර නිර්මාණය කර ලියා දක්වයි.

iii. කෝමළ ස්වර යෙදෙන නිර්දේශිත රාගයකට අයත් ඛ්‍යාල් ගීත/ගත් වාදිත (අන්තරා) ස්වර ප්‍රස්තාර කරයි.

iv. දීප්චන්දි තාලය නිවැරදිව ප්‍රස්තාර කරයි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

4.

i. බැති ගී හා කෙළි ගී විස්තර කරයි.

ii. කුන්සරණේ ගී හා ඔළිඳ කෙළි ගීවල සම විෂමතා දක්වයි.

iii. සේ ගීවල විශේෂතා විස්තර කරයි.

iv. ගුත්තිල කාව්‍යයට අයත් දොළොස් මත් පැදියක් පද ප්‍රස්තාර කරයි.

5.

i. නව නාට්‍ය ගීතය හඳුනා ගනිමින් නාට්‍ය නම් කරයි.

ii. නාඩගම් නාට්‍ය ශෛලිය හඳුනා ගනිමින් සාහිත්‍යමය ලක්ෂණ ලියා දක්වයි.

iii. ගී පාද දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කරයි.

iv.

අ) දී ඇති ගී පාදයට අදාළව තාල වාද්‍ය භාණ්ඩය නම් කරයි.

ආ) ගී පාදය හඳුනා ගනිමින් අදාළ චරිතය නම් කරයි.

ඇ) ගී පාදය හඳුනාගෙන ඊට ගැළපෙන හින්දුස්ථානි තාලය නම් කරයි.

6.

i. අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරයි.

ii. පෙරදිග ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් ප්‍රස්තාර කරයි.

iii, අපරදිග සංකේත හඳුනා භාවිත නාමයන් නම් කරයි.

iv. ටයිම් සිග්නේචරයට අනුව තිත හඳුනා ගනිමින් අදාළ බෙර පදය ප්‍රස්තාර කරයි.

7.

i . ග්‍රැමෆෝන් යුගයේ ස්වාධීන ගායක ගායිකාවන් නම් කරයි.

ii. දේශීය සංගීතඥයෙකුගේ සංගීතමය සේවාව විස්තර කරයි.

iii. නූර්ති ගීතවල රාගධාරී පසුබිම විස්තර කරයි.

iv. රේඛාව චිත්‍රපටය පිළිබඳව සුවිශේෂතා ලියා දක්වයි

v. බටහිර සංගීතඥයෙකුගෙන් සිදු වූ සේවාව විස්තර කරයි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

එක් එක් කොටසේ ලකුණු බෙදී යාම පිළිබඳ සාරාංශය

සංගීතය (පෙරදිග) - 1 පත්‍රය

එක් කොටසකට ලකුණු 01 බැගින් ප්‍රශ්න 40 ට ලකුණු 40 කි.

සංගීතය (පෙරදිග) - 11 පත්‍රය

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු වේ.

එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ප්‍රශ්න 05 ට මුළු ලකුණු 60 කි.

(1) i සිට viii දක්වා කොටස්වලට ලකුණු 01 බැගින්ද, ix හා x කොටස්වලට ලකුණු 02 බැගින් ද හිමි වේ. මුළු ලකුණු 12

(2)

i) A B C වලින් දැක්වෙන රාග තුන නම් කිරීම සඳහා එක් කොටසකට ලකුණු එක බැගින් ලකුණු:- 03

ii) මධ්‍යම ස්වරයේ සුවිශේෂතාව වෙන් වෙන්ව ලිවීමට ලකුණු:- 03

iii) යමන් හෝ භූපාලි යන රාග දෙකෙන් එකක මධ්‍යලය ගීයක/ලක්ෂණ ගීයක වාදිතයක ස්ථායි කොටස ප්‍රස්තාර කිරීමට

ලකුණු:- 06 රාගයේ නම සඳහන් කිරීමට - ල. 01
තාල සංකේත සඳහා - ල. 01
ස්වර ප්‍රස්තාරයට - ල. 04

මුළු ලකුණු - 12

(3)

i) රාග තුන නම් කිරීමට :- (ල: 1 × 3 ) ලකුණු- 03

ii) තානාලංකාර දෙක ප්‍රස්තාරය ( එක් තානාලංකාරයට ල. 01×2 ) ලකුණු- 02

iii) අන්තරා කොටස ප්‍රස්තාරය (නිවැරදි 01, ස්වර ප්‍රස්තාරයට ල.04) ලකුණු- 04

iv) දීප්චන්දි තාලය ප්‍රස්තාර කිරීමට (තාල සංකේත ල.01, යේකාවට ල.02) ලකුණු- 03

මුළු ලකුණු 12

(4)

(i) බැති ගී හා කෙළි ගී යන ගී වර්ග දෙක විස්තර කිරීමට - ල. 04

(ii) තුන් සරණේ ගී, ඔළිඳ කෙළිය යන ගී වර්ග දෙකේ සමානතා හා අසමානතා ලිවීමට - ල. 04

(iii) සෙ ගීවල ලක්ෂණ හතරක් ලිවීමට ල. 00½ බැගින් - ල. 02

(iv) ගුත්තිල කාව්‍යයේ දොළොස්මත් පැදියක මුල් පාද දෙකේ වචන ප්‍රස්තාර කිරීමට - ල. 02

මුළු ලකුණු - 12

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(5)

i අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නව නාට්‍ය තුනේ නම් ලිවීමට ලකුණු- 03

ii A තිරුවේ සඳහන් ගීතය ඇතුලත් නාට්‍ය ශෛලියේ සංගීත ලක්ෂණ 4 ට ලකුණු- 04

iii B හා C තීරුවල සඳහන් ගී පාද තාලානුකූලව ප්‍රස්තාර කිරිමට ලකුණු- 02

iv D තිරුවේ සඳහන් ,
(අ) තාල වාද්‍ය භාණ්ඩය නම් කිරීමට - ල. 01
(ආ) නාට්‍ය චරිත නාමය ලිවීමට - ල. 01
(ඇ) ගීතයට ගැළපෙන තාලය නම් කිරීමට - ල. 01
ලකුණු- 03

මුළු ලකුණු 12

(6)

i. අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ස්වර ප්‍රස්තාර කිරීමට ලකුණු- 04

ii) පළමු විභාග හතර මධ්‍යම භාවයට පෙරළා නැවත ස්වර ප්‍රස්තාර කිරීමට ලකුණු- 04

iii) a b c d වශයෙන් ලකුණු කොට ඇති අපරදිග ස්වර සංකේතවල නාම ලිවීමට ලකුණු- 02
( ල. ½ × 4 = 02 )

iv) ස්වර ප්‍රස්තාරයේ ටයිම් සිග්නේචරයට ගැළපෙන තිත හා බෙර පදය ප්‍රස්තාරයට ලකුණු- 02

මුළු ලකුණු - 12

(7) පහත සඳහන් කරුණු අතරින් තුනක් පිළිබඳව උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කිරීමට ල.4 × 3 =ලකුණු- 12

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

| | |
|---|---|
| **සංගීතය (පෙරදිග)** | **I, II** |
| சங்கீதம் (கீழைத்தேய) | I, II |
| Music (Oriental) | I, II |

2018.12.11 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සංගීතය (පෙරදිග) I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ස්වර සප්තකයට අයත් ප්‍රකෘති හා විකෘති ස්වර සංඛ්‍යාව කොපමණ ද?
(1) ප්‍රකෘති ස්වර 8යි. විකෘති ස්වර 4යි. (2) ප්‍රකෘති ස්වර 7යි. විකෘති ස්වර 5යි.
(3) ප්‍රකෘති ස්වර 6යි. විකෘති ස්වර 6යි. (4) ප්‍රකෘති ස්වර 5යි. විකෘති ස්වර 7යි.

**2.** ත්‍රිරිග, පරිස, යන ස්වර ඛණ්ඩය අයත් වන රාගය කුමක් ද?
(1) බිලාවල් (2) යමන් (3) භූපාලි (4) භෛරවී

**3.** කාෆි රාගයට අදාළ **නොවන** කරුණ තෝරන්න.
(1) සම්පූර්ණ ජාතියට අයත් වේ. (2) ෂඩ්ජය සංවාදී ස්වරය වේ.
(3) රාත්‍රි ප්‍රථම ප්‍රහරය ගායනසමය වේ. (4) රිගුරිමගුරිස වශයෙන් ස්වර සංගතියක් යෙදේ.

**4.** සරිමපනි යන ස්වර අනුවාදී වශයෙන් යෙදෙන රාගය කුමක් ද?
(1) භෛරවී (2) කාෆි (3) යමන් (4) බිලාවල්

**5.** සධ පධ මප ගම , පධ නිස නිධ ප- , යන තානාලංකාරය
(1) කාෆි රාගයට අයත් වේ. (2) යමන් රාගයට අයත් වේ.
(3) බිලාවල් රාගයට අයත් වේ. (4) භෛරවී රාගයට අයත් වේ.

**6.** කාලයෙන් තොරව නිර්මාණය වී ඇති රාගයට ආවේණික ස්වර ඛණ්ඩය හඳුන්වනු ලබන්නේ,
(1) ස්ථායි නමිනි. (2) මුඛ්‍යාංගය නමිනි. (3) මුඛඩාව නමිනි. (4) තානාලංකාරය නමිනි.

**7.** සිතාරයේ සහ එස්රාජයේ ප්‍රධාන තත් සුසර කරනුයේ
(1) ෂඩ්ජ ස්වරයට ය. (2) මධ්‍යම ස්වරයට ය.
(3) මන්ද්‍ර ෂඩ්ජ ස්වරයට ය. (4) මන්ද්‍ර මධ්‍යම ස්වරයට ය.

**8.** නිර්දේශිත රාග අතුරෙන් විකෘති ස්වර එකක් හා දෙකක් වශයෙන් යෙදෙන රාග යුගලය පිළිවෙළින්
(1) කාෆි හා භෛරවී වේ. (2) යමන් හා කාෆි වේ.
(3) බිලාවල් සහ භෛරවී වේ. (4) යමන් සහ භෛරවී වේ.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

9. යමන් රාගයේ රාග අංග වඩාත් පැහැදිලිව පෙන්නුම් කරන තානාලංකාරය තෝරන්න.
(1) සරි ගම් ප– සං– | පම් ගරි ග– ස–
(2) සරි ගප ම්– ග– | රිග පම් ගරි ස–
(3) නිරි ගම් ප– රි– | ගරි නිධ නිරි ස–
(4) ගරි නිරි ප– ගධ | ප– රිප මග රිස

10. 'X' සහ 'O' යන තාල සංකේත පමණක් යෙදෙන තාල යුගලය තෝරන්න.
(1) ත්‍රිතාල් – කෙහෙර්වා (2) දාදරා – කෙහෙර්වා (3) ජප් – දාදරා (4) දීප්චන්දි – ඛෙම්ටෝ

11. නිර්දේශිත තාල අතුරෙන් මාත්‍රා දෙක බැගින් විභාග වන තාල යුගලය තෝරන්න.
(1) ත්‍රිතාල් – දාදරා (2) ජප් – දීප්චන්දි (3) ඛෙම්ටෝ – ලාවනී (4) කෙහෙර්වා – ජප්

12. ලාවනී සහ කෙහෙර්වා යන තාල දෙකටම පොදු ලක්ෂණයක් වන්නේ,
(1) තාල විභාග සංඛ්‍යාව සමාන වීමයි.
(2) තාල විභාගයක යෙදෙන මාත්‍රා ගණන සමාන වීමයි.
(3) ඨේකා පදය සමාන වීමයි.
(4) තාල සංකේත සමාන වීමයි.

13. මමපධ, නිනිසං ලෙස අන්තරා ආරම්භ වන රාගය වන්නේ
(1) බිලාවල් ය. (2) යමන් ය. (3) භෛරවී ය. (4) කාෆි ය.

● අංක 14 සිට 18 තෙක් ඇති ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | මේලය | ගානසමය | රාගයේ විකෘති ස්වර | වාදි–සංවාදි | රාගයට අදාළ ස්වර සංගති |
|---|---|---|---|---|---|
| A | | | නැත | ග–ධ | පග, ධපග |
| B | | දිවා ප්‍රථම ප්‍රහරය | නැත | | මග, මරිස |
| C | | දිවා ප්‍රථම ප්‍රහරය | | ම–ස | |
| D | කාෆි | මධ්‍යම රාත්‍රී | | | |

14. ඉහත A, B හා C අක්ෂරවලට අදාළ වන නිර්දේශිත රාග තුන වන්නේ පිළිවෙළින්
(1) යමන්, භූපාලි සහ බිලාවල් ය. (2) භූපාලි, බිලාවල් සහ භෛරවී ය.
(3) භූපාලි, භෛරවී සහ කාෆි ය. (4) යමන්, කාෆි සහ බිලාවල් ය.

15. D තීරුවෙහි දැක්වෙන හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.
(1) ගුනි , ස–ප , සරිප (2) නිගු , රි–ප , පරිස
(3) නිගු , ප–ස , සරිප (4) ගුනි , ස–ම , පරිස

16. B තීරුවට අයත් රාගයේ මේලය සහ වාදි–සංවාදි ස්වර පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.
(1) බිලාවල්, ග–ධ (2) කල්‍යාණ, ග–නි (3) බිලාවල්, ධ–ග (4) කල්‍යාණ, ස–රි

WWW.OLEVELAPI.COM

17. A තීරුවට අදාළ මේලයේ නම සහ ගානසමය පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.
(1) කල්‍යාණ , දිවා ප්‍රථම ප්‍රහරය (2) බිලාවල් , රාත්‍රී ප්‍රථම ප්‍රහරය
(3) බිලාවල් , දිවා ප්‍රථම ප්‍රහරය (4) කල්‍යාණ , රාත්‍රී ප්‍රථම ප්‍රහරය

18. C තීරුවට අයත් රාගයෙහි විකෘති ස්වර සහ ස්වර සංගතීන් පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.
(1) රි ගු ධ නි , ම ගු ස රි ස (2) රි ගු ධ නි , සඳ නිරිස
(3) ගු නි , රි ගු ම ම ප (4) ගු නි , රි ගු ම රි ස


19. භාරතීය සංගීතඥයින් පිළිබඳ නිවැරදි ප්‍රකාශනය තෝරන්න.
(1) උස්තාද් ශකීර් හුසේන් තත් වාද්‍ය භාණ්ඩයක් සඳහා සුප්‍රසිද්ධ ය.
(2) උස්තාද් ශකීර් හුසේන් සුෂිර වාද්‍ය භාණ්ඩයක් සඳහා සුප්‍රසිද්ධ ය.
(3) පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා අවනද්ධ වාද්‍ය භාණ්ඩයක් සඳහා සුප්‍රසිද්ධ ය.
(4) පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා සුෂිර වාද්‍ය භාණ්ඩයක් සඳහා සුප්‍රසිද්ධ ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**20.** භූපාලි රාගයට අනුව ගරිසරි, පගරිග වශයෙන් ගොඩනැගෙන ස්වර අභ්‍යාසයේ තුන්වන සහ සතරවන පියවර පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?
(1) පධපග, පධසංධ　　(2) ධපගප, ධසංධප
(3) ධපගප, සංධපධ　　(4) පධගප, ධසංපධ

- අංක **21** සිට **24** තෙක් ඇති ප්‍රශ්නවලට පහත සඳහන් රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



A　　B　　C　　D

**21.** 'ජෙංගත් ජෙංගත් ජෙං ජෙං තා' යන බෙරපදය වාදනය කිරීමට සුදුසු භාණ්ඩය දැක්වෙන අක්ෂරය කුමක් ද?.
(1) A　　(2) B　　(3) C　　(4) D

**22.** B අක්ෂරයෙන් දැක්වෙන භාණ්ඩයෙන් වාදනය කළ හැකි බෙරපදය කුමක් ද?
(1) දොංජී ජිගත　　(2) ජිමි තකු දත් දොම්
(3) ගුංද දෙගත ගදිගත ගුඳ　　(4) දොං ජිංත ගත දොංත

**23.** C අක්ෂරයෙන් දැක්වෙන භාණ්ඩය යොදාගනු ලබන රංග ශෛලිය වන්නේ,
(1) සොකරි ය.　　(2) කෝලම් ය.　　(3) නූර්ති ය.　　(4) නාඩගම් ය.

**24.** D අක්ෂරයෙන් දැක්වෙන භාණ්ඩය සහාය වාදනයට යොදා ගනිමින් ගායනය කළ හැකි ගී පාදය තෝරන්න.
(1) ගම්වල සැම තැන ඇවිද ගොසින්නේ　　(2) වෙදා නටන්නේ පළමුව අවසර ගන්නේ
(3) ගම්භිර කාලිංග නුවර　　(4) මං වගේ පේඩි කතක් මනා

**25.** භෛරවී රාගය ආශ්‍රයෙන් නිර්මාණය වූ නූර්ති ගීතයේ මුල් පද පෙළ තෝරන්න.
(1) සවන් දී පෙර රාම චරිතේ අසව්　　(2) රකිනු ඊශ්වරා
(3) අප ගුණ සරු සිංහල භූපතී　　(4) ලෝනා මුනි රාජගේ

**26.** අනාඝාතාත්මකව ගැයෙන මෙහෙ ගී පාදය තෝරන්න.
(1) බුද්ධං සරණේ සිරස දරාගෙන　　(2) පැහැසරණිය මිණිපැමිණිය කොත් අගට
(3) අතට වෙරළු ඇහිඳ ගෙනේ　　(4) වෙල්යායක ගොත් දෙන්නෙක් කකා උනී

**27.** 'රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා' යනුවෙන් ගැයෙන සේ ගී පාදයේ,
(1) සඳැස්මත් 16ක් සහ ගීමත් 20 කි.　　(2) සඳැස්මත් 20ක් සහ ගීමත් 22 කි.
(3) සඳැස්මත් 24ක් සහ ගීමත් 32 කි.　　(4) සඳැස්මත් 26ක් සහ ගීමත් 28 කි.

**28.** 'සමන් පිච්ච මල් අත්තට පිණි වැටිලා' යන ගී පාදයේ ගුරු අක්ෂර සංඛ්‍යාව
(1) හතරකි.　　(2) පහකි.　　(3) හයකි.　　(4) අටකි.

WWW.OLEVELAPI.COM

**29.** වෙස්සන්තර නාඩගමේ එන 'ඒ බුදු බව පතමින් ලොබිනේ' ගීතය පාදක කරගෙන නිර්මාණය වූ නවනාට්‍ය ගීතය කුමක් ද?
(1) ළප නොමවන් සඳ සේ සොම් ගුණෙනා　　(2) මෑ වේ මා දුටු කොමළ ලියා
(3) දස දෙස ඉන්ද්‍රා වෙමි මම සිංහ රාජ මෘගේන්ද්‍රා　　(4) බුදුකුල් ගුණැති සමිඳුනි සැරදේ

**30.** බෙරපදය, තානම, කවිය, ඉරට්ටිය වශයෙන් කොටස් හතරකට බෙදෙන්නේ,
(1) කෝකිල වන්නමයි.　　(2) තිසරා වන්නමයි.
(3) උකුසා වන්නමයි.　　(4) පහතරට සින්දු වන්නමයි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- අංක **31** සිට **34** තෙක් ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා චිත්‍රපටවලට අදාළ පහත සඳහන් ගී පාද උපයෝගී කරගන්න.

  **A** - හද රාහු මුඛයේහි ගිලුනා ලෙසේ
  **B** - සිරිදැරූ හෙළ දිව පුරාතනේ
  **C** - ඕලු නෙළුම් නෙරිය රඟාලා

**31.** **A, B** සහ **C** යටතේ එන ගීත ඇතුළත් චිත්‍රපට පිළිවෙළින්,
(1) රේඛාව, මාතලන් සහ සැඩසුළං වේ. (2) මාතලන්, සැඩසුළං සහ රේඛාව වේ.
(3) සැඩසුළං, රේඛාව සහ මාතලන් වේ. (4) මාතලන්, රේඛාව සහ සැඩසුළං වේ.

**32.** **A** ගීතය ඇතුළත් චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂවරයා,
(1) ආර්. මුත්තුසාමි වේ. (2) ආනන්ද සමරකෝන් වේ.
(3) සුනිල් සාන්ත වේ. (4) මොහොමඩ් ගවුස් වේ.


**33.** **B** හි ඇතුළත් ගීතය ගැයූ ගායිකාව තෝරන්න.
(1) ආශා බෝස්ලේ (2) ජමුනා රාණි (3) කේ. රාණි (4) ලතා මංගේශ්කර්

**34.** **C** හි ඇතුළත් ගීතය ගැයූ ගායකයා වන්නේ,
(1) තිලකසිරි ප්‍රනාන්දු ය. (2) සිසිර සේනාරත්න ය.
(3) ඩබ්ලිව්. ඩී. අමරදේව ය. (4) අයිවෝ ඩෙනිස් ය.

**35.** සංගීත භාණ්ඩවල හඬ එකිනෙකින් වෙන්කොට හඳුනා ගැනීමට තරංග රටාවේ වෙනස හේතුවන අතර එම ලක්ෂණය හඳුන්වනු ලබන්නේ,
(1) තාරතාවය වශයෙනි. (2) විපුලතාව වශයෙනි.
(3) ධ්වනි ගුණය වශයෙනි. (4) රූපභේදය වශයෙනි.

**36.** යමන් රාගයේ ආරෝහණ ස්වරයන්ට ගැළපෙන අපරදිග ස්වර පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.
(1) CDEF$^{\#}$GAB (2) CDEFG$^{\#}$AB (3) CDEFGA$^{\#}$B (4) CDEFGAB$^{\#}$

- අංක **37** සහ **38** ප්‍රශ්නවලට පහත සඳහන් ස්වර පුවරුව අදාළ කර ගනිමින් පිළිතුරු සපයන්න.




**37.** F Major Chord එක සඳහා යොදා ගන්නා ස්වරයන්ට හිමි අංක නිවැරදිව සඳහන් වරණය කුමක් ද?
(1) 6, 9, 13 (2) 1, 5, 8 (3) 5, 7, 10 (4) 6, 10, 13

WWW.OLEVELAPI.COM

**38.** ඉහත ස්වර පුවරුවෙහි සඳහන් 1, 3, 4, 6, 8, 10, 11, 13 අංකවලින් පිළිබිඹු වන ආරෝහණය අයත් රාගය කුමක් ද?
(1) යමන් (2) භූපාලි (3) කාෆි (4) භෛරවී

**39.** යතුරු පුවරුව සහිත සංගීත භාණ්ඩ මගින් ඉදිරිපත් කරනු ලබන සංගීත නිර්මාණ හැඳින්වීම සඳහා භාවිත නාමය
(1) E Music වේ. (2) Midi Music වේ.
(3) Key Board Music වේ. (4) Popular Music වේ.

**40.** මල්ටි ට්‍රැක් රෙකෝඩින් (Multi-Track Recording) යනු
(1) එක් එක් භාණ්ඩයෙන් නිකුත් වන සංගීතය වෙනම පටිගත කිරීම ය.
(2) විවිධ සංගීත භාණ්ඩ එකවර වාදනය කර පටිගත කිරීම ය.
(3) ගායනය හා වාදනය පමණක් පටිගත කිරීම ය.
(4) වාදනය පටිගත කර ගායනය සජීවී ලෙස ඉදිරිපත් කිරීම ය.

* *



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

| විෂයය අංකය<br>பாட இலக்கம் | 40 | විෂයය<br>பாடம் | සංගීතය (පෙරදිග) |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 1 | 31. | 2 |
| 02. | 2 | 12. | 3 | 22. | 3 | 32. | 1 |
| 03. | 3 | 13. | 4 | 23. | 4 | 33. | 4 |
| 04. | 3 | 14. | 2 | 24. | 2 | 34. | 2 |
| 05. | 4 | 15. | 3 | 25. | 3 | 35. | 3 |
| 06. | 2 | 16. | 3 | 26. | 4 | 36. | 1 |
| 07. | 4 | 17. | 4 | 27. | 4 | 37. | 4 |
| 08. | 2 | 18. | 1 | 28. | 2 | 38. | 3 |
| 09. | 3 | 19. | 4 | 29. | 2 | 39. | 1 |
| 10. | 2 | 20. | 3 | 30. | 4 | 40. | 1 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |
|---|---|---|---|



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## 40 - සංගීතය (පෙරදිග) - II පත්‍රය

1. අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) 'නිසගුම ධුප' ස්වර සංගතිය යෙදෙන රාගයෙහි ජාතිය නම් කරන්න.

(ii) යමන් රාගයෙහි යෙදෙන මධ්‍යම ස්වරය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(iii) ඛලි ස්ථානය හයවන මාත්‍රාවෙහි යෙදෙන තාලය නම් කරන්න.

(iv) ඛ්‍යාල් ගායනා සඳහා යොදාගනු ලබන තාල වාද්‍ය භාණ්ඩය නම් කරන්න.

- අංක (v) සිට (viii) තෙක් ප්‍රශ්නවල දී ඇති හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(v) සත්‍යජිත් රායිගේ පාතර් පංචාලි චිත්‍රපටයට පසුබිම් සංගීතය නිර්මාණය කරන ලද්දේ ................. විසිනි.

(vi) 'ගැඹුරු සත් සමුදුර පතුල බිඳ' යන ගී පාදය සඳහා වැයීමට සුදුසු හින්දුස්ථානි තාලය ..................... ලෙස හැඳින්වේ.

(vii) විශාරද නන්දා මාලනී විසින් ගයන 'අම්මාවරුනේ' ගීතයෙහි තනුව නිර්මාණය කර සංගීතවත් කරන ලද්දේ ........................................ සූරීන් විසිනි.

(viii) 'නෙයිනාගෙ සුදුව' නාට්‍යමය ජවනිකාව ඇතුළත් වන්නේ ................................... නාට්‍යයෙහි ය.

- ප්‍රශ්න අංක (ix) සහ (x) හි හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුරු වරහන් තුළින් තෝරා ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(උරුට්ටුව, කපිරිඤ්ඤා, නූර්ති, $^{6}_{8}$, $^{4}_{4}$)

(ix) ...................................... ගීත සම්ප්‍රදාය ඇසුරු කරමින් නිර්මාණය වූ 'රස ආහර කවලා - රන් කුඩුවේ දමලා' යන සිංහල ගීතය .................................... රිද්මය මුල්කරගෙන නිර්මාණය වී ඇත.

(x) ...................................... ගීතයක තාලයෙන් තොරව ගැයෙන කොටස දොහොරාව වන අතර නාඩගම් ගීතයක ද්‍රැත ලයෙන් ගැයෙන කොටස ........................ වේ.

1.

(1) **i** සිට **viii** දක්වා කොටස්වලට ලකුණු 01 බැගින්ද, **ix** හා **x** කොටස්වලට ලකුණු 02 බැගින්ද හිමි වේ. මුළු ලකුණු 12

I. සම්පූර්ණ ජාති
II. තීව්‍ර මධ්‍යමය
III. ඝඩප් තාලය
IV. තබ්ලාව
V. රවිශංකර්
VI. දීප්චන්දි තාලය
VII. ප්‍රේමසිරි කේමදාස
VIII. මධුර ජවනිකා
IX. කපිරිඤ්ඤා / $^{6}_{8}$
X. නූර්ති / උරුට්ටුව

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

2. පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග තුනකට අයත් ස්වර ඛණ්ඩ කිහිපයකි.

A - ගප, ධනි, සර්ස්

B - ගප, නිධ, නිර්ස්

C - ගප, ධධ, සර්ස්

(i) ඉහත A, B, C හි දැක්වෙන ස්වර ඛණ්ඩවලට අයත් වන රාග පිළිවෙලින් නම් කරන්න.

(ii) එම රාග තුනට අදාළව මධ්‍යම ස්වරයෙහි සුවිශේෂීතාවය වෙන වෙනම රාග නාමය ඉදිරියෙන් ලියන්න.

(iii) ඉහත A, B, C කොටස්වලින් පිළිබිඹු වන කල්‍යාණ මේලගත රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටසක් තාල සංකේත සහිතව ස්වර ප්‍රස්තාර කරන්න.

2.

**i) A B C වලින් දැක්වෙන රාග තුන නම් කිරීම සඳහා එක් කොටසකට ලකුණු එක බැගින්** **ලකුණු:- 03**

**ii) මධ්‍යම ස්වරයේ සුවිශේෂතාව වෙන් වෙන්ව ලිවීමට** **ලකුණු:- 03**

**iii) යමන් හෝ භූපාලි යන රාග දෙකෙන් එකක මධ්‍යලය ගීයක/ලක්ෂණ ගීයක වාදිතයක ස්ථායි කොටස ප්‍රස්තාර කිරීමට**

**ලකුණු:- 06 රාගයේ නම සඳහන් කිරීමට - ල. 01**
**තාල සංකේත සඳහා - ල. 01**
**ස්වර ප්‍රස්තාරයට - ල. 04** **මුළු ලකුණු - 12**

i.

A. - බිලාවල් රාගය

B. – යමන් රාගය

C. – භූපාලි රාගය

ii.

A. බිලාවල් රාගය :- (පිළිතුර පහතින් දැක්වෙන ඕනෑම ආකාරයකට ඉදිරිපත් කළ හැකියි.)

මධ්‍යමය
- ශුද්ධ ව යෙදේ.
- අනුවාදිව යෙදේ.
- ආරෝහණ, අවරෝහණ දෙකෙහිම යෙදේ.

B. යමන් රාගය
- තීව්‍ර මධ්‍යමය යෙදේ. (මධ්‍යමය තීව්‍ර වේ.)

C. භූපාලි රාගය
- මධ්‍යමය නොයෙදේ හෝ වර්ජිත වේ. (වර්ජ්‍ය වේ.)

iii. යමන් හෝ භූපාලි යන රාග දෙකෙන් එකක මධ්‍ය ලය ගීතයක, ලක්ෂණ ගීතයක, වාදිතයක ස්ථායි කොටස ප්‍රස්තාර කර තිබීම.



W W W . O L E V E L A P I . C O M
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

3. නිර්දේශිත රාග තුනක් හඳුනා ගැනීම සඳහා උපකාරී වන තොරතුරු දෙකක් පහත දැක්වේ.

A - කල්‍යාණ මේලගත නිර්දේශිත රාග දෙකකි.

B - ශුද්ධ ස්වර පමණක් යෙදෙන නිර්දේශිත රාග දෙකකි.

(i) ඉහත තොරතුරු මගින් පිළිබිඹු වන රාග **තුන** නම් කරන්න.

(ii) එම රාග තුනෙන් කැමති රාගයකට අනුව මාත්‍රා 8 කට නොඅඩු තානාලංකාර **දෙකක්** ලියන්න.

(iii) කෝමල ස්වර සහිත නිර්දේශිත රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ වාදිතයක හෝ අන්තරා කොටසක් ස්වර ප්‍රස්තාර කරන්න.

(iv) දීප්චන්දි තාලය නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න.

3.

| | | |
|---|---|---|
| i) | රාග තුන නම් කිරීමට :- (ලං 1 × 3 ) | ලකුණු- 03 |
| ii) | තානාලංකාර දෙක ප්‍රස්තාර කිරීම සඳහා ( එක් තානාලංකාරයට ල. 01×2 ) | ලකුණු- 02 |
| iii) | අන්තරා කොටස ප්‍රස්තාර කිරීම සඳහා | ලකුණු- 04 |
| iv) | දීප්චන්දි තාලය තාල ප්‍රස්තාර කිරීමට (තාල සංකේත ල.01,රේඛාව ට ල.02) | ලකුණු- 03 |

මුළු ලකුණු - 12

i. යමන් රාගය

භූපාලි රාගය

බිලාවල් රාගය

ii. ඉහත රාග අතුරින් කැමති රාගයකට අදාළව තානාලංකාර දෙකක් (මාත්‍රා අටකට වැඩි) තාලානුකූලව ප්‍රස්තාර කිරීම හෝ මාත්‍රා අටකට නොඅඩුව ලියා තිබීම.

උදා:- නිරි ගම් පධ නිස් / නිධ පම් ගරි ස-/

iii. කාෆි හෝ භෛරවී යන රාග දෙකෙන් එක් රාගයක මධ්‍යලය ගීතයක, ලක්ෂණ ගීතයක හෝ වාදිතයක අන්තරා කොටස නිවැරදිව ස්වර සංකේත සහිතව ප්‍රස්තාර කර තිබීම.

iv. දීප්චන්දි තාලය ප්‍රස්තාර කිරීම.

4. (i) බැති ගී සහ කෙළි ගී යන ගී වර්ග **දෙක** පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(ii) තුන්සරණේ ගී, ඔළිඳ කෙළිය යන ගී වර්ග දෙකේ සමානතා **දෙකක්** හා අසමානතා **දෙකක්** ලියා දක්වන්න.

(iii) සේ ගීවල විශේෂ ලක්ෂණ **හතරක්** ලියන්න.

(iv) ගුත්තිල කාව්‍යයේ එන, දොළොස්මත් පැදියක මුල්පාද දෙකේ වචන පමණක් ප්‍රස්තාර කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) | බැති ගී හා කෙළි ගී පිළිබඳ විස්තර කිරීමට | - | ල. 04 |
| (ii) | තුන් සරණේ ගී, ඔළිඳ කෙළිය යන ගී වර්ග දෙකේ සමානතා හා අසමානතා ලිවීමට | - | ල. 04 |
| (iii) | සේ ගීවල ලක්ෂණ හතරක් ලිවීමට ල. 00½ බැගින් | - | ල. 02 |
| (iv) | ගුත්තිල කාව්‍යයේ දොළොස්මත් පැදියක මුල් පාද දෙකේ වචන ප්‍රස්තාර කිරීමට | - | ල. 02 |

මුළු ලකුණු 12



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**(i)**

❖ බැති ගී
- භක්තිය ප්‍රකාශ කෙරෙන ගීත විශේෂයක් වීම.
- බැති ගී වැඩි වශයෙන් ආසාතාත්මකව ගායනය කිරීම.
- බුදුන්, දහම්,සඟුන් යන තෙරුවන් සම්බන්ධව ගායනය කළ ගීත විශේෂයක් වීම.
- ඇදහිලි ගී ගණයට අයත් වීම.
- බැති ගී බොදු බැති ගී, කිතු බැති ගී ආදි වශයෙන් ආගමික පදනමක් මත භාවිත වීම.
- සරල භාෂාව හා ඒකාකාරී තනු භාවිත වීම.

❖ කෙළි ගී
- කෙළි ගී සමාජ ගී ගණයට අයත් වීම.
- වැඩි වශයෙන් මෙම ගීත ආසාතාත්මකව ගායනය කිරීම.
- ක්‍රීඩා කිරීමේ දී ගායනා කළ ගීත විශේෂයක් වීම.
- විනෝදාස්වාදය සඳහා ගායනා කිරීම.
- ප්‍රාසාංගිකව ඇගයීමට හැකි ගීත විශේෂයක් වීම.
- ක්‍රීඩාවේ ස්වභාවයට උචිත තනු භාවිත වීම.
- ශුද්ධ ස්වර ඇසුරු කළ තනු වැඩි වශයෙන් යෙදීම.
- සමූහ ගායනයට හා අංග චලනයට උචිත රිද්මයෙන් යුක්ත වීම.
- සරල නාද මාලා යෙදීම.

**(ii)** තුන්සරණේ ගී සහ ඔළිඳ කෙළිය

➢ <u>සමානතා</u>
- මෙම ගී වර්ග දෙකම ගැමි ගී වර්ගයට අයත් වීම.
- ඒකලව හා සාමූහිකව ගායනය කළ හැකි ගීත විශේෂයක් වීම.
- ගී වර්ග ගායනය කිරීමේ දී දේශීය වාද්‍ය භාණ්ඩ සහාය වාදනය සඳහා යොදා ගැනීම.
- දේශීය තිත් අනුව ගායනා කිරීම.
- පටු ස්වර පරාශයක පිහිටා ගායනා කිරීම

<u>අසමානතා</u>

| තුන්සරණේ ගී | ඔළිඳ කෙළිය |
|---|---|
| • ඇදහිලි ගී ගණයට අයත් වීම.<br>• බැති ගී නමින් හැඳින් වීම.<br>• භක්තිය ප්‍රකාශ කෙරෙන ගීත විශේෂයක් වීම.<br>• නාදමාලා ඒකාකාරී වීම.<br>• ආගමික පසුබිමක් තුළ ගායනා කළ ගීත විශේෂයක් වීම.<br>• බාල, මහළු සෑම අයෙකුටම ගායනය කළ හැකි වීම. | • සමාජ ගී ගණයට අයත් වීම.<br>• කෙළි ගී නමින් හැඳින් වීම.<br>• විනෝදාස්වාදය සඳහා ගැයූ ගීත විශේෂයක් වීම.<br>• ප්‍රාසාංගිකව ගායනය කළ හැකි වීම.<br>• විවිධ තනු අනුව නාද මාලා නිර්මාණය වීම.<br>• ගෘහස්ථව ගැයූ ගීත විශේෂයක් වීම.<br>• කාන්තාවන්ට සුවිශේෂී වීම. |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**iv. සේ ගී**

- භාෂා ශාස්ත්‍ර පිළිබඳ හසළ බුද්ධියකින් යුත් උගතුන් විසින් නිර්මාණය කිරීම.
- භාෂාව ව්‍යක්ත වීම.
- විවිධ තේමා මත රචනා වී ඇත, කාව්‍යාලංකාර සහිතව වර්ණනා ඇතුළත් ගීත විශේෂයක් වීම.
- නාදරටාවට වඩා භාෂාවට ප්‍රධාන තැනක් දීම.
- ප්‍රශස්ති, වන්නම්, හටන් ගී, වැළපුම් ගී සංදේශ කාව්‍ය, ගුත්තිල කාව්‍යයේ එන ගීත සේ ගී වර්ගයට අයත් වීම.
- සේ ගී නිර්මාණවල නිශ්චිත කතුවරයෙක් සිටීම.
- නාද මාලා විවිධ විරිත්වලට අයත් වීම.
- රචකයා නාමික වීම.
- ග්‍රන්ථාරූඪ වී තිබීම.
- එළිසමය, අනුප්‍රාසය ලක්ෂණවලින් යුක්ත වීම

(iv)

- / ස ඳ වා s /සු දු වැ ලි / පි වි තු රු /බ ඳ වා s / ර න් ද ද / පි ය ක රු /
- /ස ඳ වා / s සු දු / වැ ලි පි / වි තු රු / බ ඳ වා / s ර න් / ද ද පි / ය ක රු /

( මෙම ක්‍රම දෙකටම ප්‍රස්තාර කළ හැකියි.)

**5.** පහත වගුවෙහි **A, B, C** හා **D** යන තීරුවලින් දැක්වෙන්නේ ලංකාවේ ප්‍රචලිත නාට්‍ය ගීත හතරක මුල් පාද ය.

| A | B | C | D |
|---|---|---|---|
| මෙමගින් ගිය රුසිරු එ තරුණා | ප්‍රේමයෙන් මන රංජිත වේ, තන්දිත වේ | වගුරට නරනිඳු දඹදිව පරසිඳු | ආලේ බැන්ද මාගේ රම්‍යවන් |

(i) ඉහත ගීත අතුරෙන් තුනක් නවනාට්‍ය ශෛලියට අයත් වේ. අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග එම නවනාට්‍ය **තුනෙහි** නම් ලියන්න.

(ii) **A** තීරුවෙහි සඳහන් ගීතය අයත් වන නාට්‍ය ශෛලියේ සංගීතමය ලක්ෂණ **හතරක්** ලියන්න.

(iii) **B** හා **C** තීරුවල සඳහන් ගී පාද තලානුකූලව ප්‍රස්තාර කරන්න.

(iv) **D** තීරුවෙහි සඳහන් නාට්‍ය ගීතය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) යොදා ගන්නා තාල වාද්‍ය භාණ්ඩය නම් කරන්න.

(ආ) එම ගීතය ගයනු ලබන නාට්‍යයෙහි එන චරිත නාමය ලියන්න.

(ඇ) එම ගීතයේ තාලයට ගැළපෙන හින්දුස්තානි තාලය නම් කරන්න.

WWW.OLEVELAPI.COM

5.

**i)** අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නව නාට්‍ය තුනේ නම් ලිවීමට — ලකුණු- 03

**ii) A** තිරුවේ සඳහන් ගීතය සඳහන් නාට්‍ය ශෛලියේ සංගීත ලක්ෂණ 4 ට — ලකුණු- 04

**iii) B** හා **C** තීරුවල සඳහන් ගී පාද තාලානුකූලව ප්‍රස්තාර කිරීමට — ලකුණු- 02

**iv). D** තීරුවේ සඳහන් ,

(අ) තාල වාද්‍ය භාණ්ඩය නම් කිරීමට - ල. 01

(ආ) නාට්‍ය චරිත නාමය ලිවීමට - ල. 01

(ඇ) ගීතයට ගැළපෙන තාලය නම් කිරීමට - ල. 01

ලකුණු- 03

**මුළු ලකුණු 12**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

i.

B. ප්‍රේමයෙන් මන :- මනමේ නාටකය
C. වගු රට නරනිඳු :- සිංහබාහු නාටකය
D. ආලේ බැන්ද :- කාලගෝල නාටකය

ii. නාඩගම් සංගීතය

- කර්ණාටක රාගධාරී සංගීතය පදනම් වීම.
- ප්‍රධාන තාල වාද්‍යය මද්දලය වීම.
- මද්දලයෙන් අඩුතාල සහ වැඩි තාල වැයීම.
- පොතේගුරු හා වෙනත් චරිත ගයන ගී පාදවලට අත්වැල් ගායක කණ්ඩායම සහාය ගායනය ඉදිරිපත් කිරීම.
- සර්පිනාව, හොරණෑව, තාලම්පට වාදනයෙන් සහාය කර ගැනීම.
- පසු කාලීනව වයලීනය ද, සංගීතය සඳහා යොදා ගැනීම.
- කීර්තනම්, පසන්, තිර්ලානා ආදි නාඩගම් තාල වාදනය කිරීම.
- බොහෝ ගීතවල '**උරුට්ටුව**' නමින් කොටසක් ඇතුළත් වීම.

iii.

❖ ප්‍රේමයෙන් මන


/ ප්‍රේ s ම / යෙන් ම න / රං ජිත වේ / තුන් දිත වේ /

❖ වගුරට නරනිඳු

/ ව ගු s / ර s ට s / න ර s / නි s ඳු s / ද ඹ s / දි s ව s / ප ර s / සි s ඳු s /

iv. (අ) මද්දලය (ආ) කාලගෝල (ඇ) බෙම්බටෝ

6. පහත දැක්වෙනුයේ අපරදිග ස්වර ප්‍රස්තාරයකින් උපුටාගත් කොටසකි.




(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට අනුව ස්වර ප්‍රස්තාර කරන්න.
(ii) පෙරදිග ක්‍රමයට අනුව ප්‍රස්තාර කරන ලද ස්වර ප්‍රස්තාරයේ පළමු විභාග හතරට අයත් ස්වර, මධ්‍යම භාවයට පෙරළා නැවත ස්වර ප්‍රස්තාර කරන්න.
(iii) ඉහත ස්වර ප්‍රස්තාරයේ a, b, c, d වශයෙන් ලකුණු කොට ඇති අපරදිග ස්වර සංකේත සඳහා භාවිත නාමයන් ලියා දක්වන්න.
(iv) ඉහත ස්වර ප්‍රස්තාරයේ දැක්වෙන ටයිම් සිග්නේචරයට (time signature) ගැළපෙන දේශීය 'තිත' නම් කර, බෙර පදය ප්‍රස්තාර කරන්න.

WWW.OLEVELAPI.COM

**i. අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ස්වර ප්‍රස්තාර කිරීමට ලකුණු- 04**

**ii) පළමු විභාග හතර මධ්‍යම භාවයට පෙරළා නැවත ස්වර ප්‍රස්තාර කිරීමට ලකුණු- 04**

**iii) a b c d වශයෙන් ලකුණු කර ඇති අපරදිග ස්වර සංකේත වල නාම ලිවීමට ලකුණු- 02**
**( ල. ½ × 4 = 02 )**

**iv) ස්වර ප්‍රස්තාරයේ ටයිම් සිග්නේචරයට ගැළපෙන තිත හා බෙර පදය ප්‍රස්තාරයට ලකුණු- 02**

**මුළු ලකුණු -12**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

i.

/පධ පම ග ප / ස - නි ධ / ප ධ ප ම / ග - - - / පධ පම ග ප / ම - ග ම / ග - රි නි / ස - - - /

ii.

/ ස්රි ස්නි ධ ස / ම් - ග් රි / ස් රි ස් නි / ධ - - - /

iii.

a. Quaver

b. Crotchet

c. Minim

d. Semi Breave

iv. 4/4 Time = මහ තනිතිත

/ දො දො ං ත / ත කු දො ං /

හෝ

/ ත දො ං දො / මි ත දො ං /

**7.** පහත සඳහන් කරුණු අතුරෙන් **තුනක්** පිළිබඳ ව උදාහරණ සහිත ව කෙටියෙන් විස්තර කරන්න.

(i) ග්‍රැමෆෝන් යුගයේ ජනප්‍රිය වූ ස්වාධීන ගී හා ගායක ගායිකාවන්
(ii) සී. ද. එස් කුලතිලක සූරීන් විසින් සිදු කරන ලද සංගීතමය සේවාව
(iii) නූර්ති ගීතවල රාගධාරී පසුබිම
(iv) සිංහල චිත්‍රපට ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයක් ගත් 'රේඛාව' චිත්‍රපටය
(v) බටහිර සංගීතඥ මොසාර්ට් විසින් සංගීතයට සිදු කළ සේවාව

7. දී ඇති මාතෘකා කරුණු අතරින් තුනක් පිළිබඳව උදාහරණ සහිතව

WWW.OLEVELAPI.COM

කෙටියෙන් ප්‍රස්තාර කිරීමට ල.4 × 3 =ලකුණු- 12

**i.** ග්‍රැමෆෝන් යුගයේ ජනප්‍රිය වූ ස්වාධීන ගී හා ගායක ගායිකාවන්

- අනුකරණවලින් තොරව නිර්මාණය කළ ගී තනු මේ ගණයට අයත්වේ. ඒ අනුව,
  1. බැස සීතල ගඟුලේ ......
  2. එන්නද මැණිකේ මමත් දියඹටා.......
  3. අක්කේ අක්කේ අර බලන්නකෝ........
  4. වරෙන් හීන් සැරේ.........
  5. ඕලු පිපීලා .......... ආදි ගීත උදාහරණ ලෙස දැක්විය හැකිය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- **ග්‍රැමෆෝන් යුගයේ ගායක ගායිකාවන් වශයෙන්,**

  ආනන්ද සමරකෝන්
  සුනිල් සාන්ත
  ඇම්.කේ.වින්සන්ට්
  ඒ.එම්.යූ.රාජ්
  වසන්තා සන්දනායක

**ii. සී.ද.එස්.කුලතිලක සූරීන් සංගීතයට සිදු කළ සේවාව**

- ජන සංගීත පර්යේෂකයෙකු වශයෙන් (මියැසිය වැඩසටහන) සේවය කිරීම.
- සංගීතය පිළිබඳ පොත් පත් රචනා කර ඇත.(ජන සංගීත සිද්ධාන්ත, විශ්ව සංගීත ක්ෂේත්‍රය, ලංකාවේ සංගීත සම්භවය, දහ අට වන්නම්, ආසියා හා පැසිපික් කලාපයේ සංගීත භාණ්ඩ)
- ගුවන් විදුලි සංස්ථාවේ සංගීත පර්යේෂණ අංශයේ ප්‍රධානියා වශයෙන් සේවය කිරීම.
- ලංකා කලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සේවය කිරීම.
- මහරගම ගුරු විද්‍යාලයේ සංගීත කථිකාචාර්යවරයෙකු වශයෙන් සේවය කිරීම.
- ජාත්‍යන්තර සංගීතඥයින්ගේ රැස්වීම්වල දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.

**iii. නූර්ති ගීතවල රාගධාරී පසුබිම.**

- නූර්ති ගීත සඳහා උත්තර භාරතීය රාගධාරී සංගීතය පදනම් වීම.
- හින්දුස්ථානි තාල මත (කෙහෙර්වා, දීප්චන්දි, ත්‍රිතාල්) නූර්ති ගී නිර්මාණය වී තිබීම.
- තාල වාද්‍ය භාණ්ඩය ලෙස තබ්ලාව යොදා ගැනීම.
- සංගීතයට නතු වීම නිසා ඇතැම් ගීතවල බස් වහර ව්‍යක්ත නොවීම.
- නාට්‍ය රසය යටපත් කොට ගෙන සංගීත රසය ඉස්මතු වීම.
- සමහර ගීතවල රාගධාරී **'දොහොරා'** අංග ඇතුළත් වීම.

**iv. සිංහල චිත්‍රපට ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයක් ගත් රේඛාව චිත්‍රපටය.**

- පසුබිම් සංගීතය හා වාද්‍ය වෘන්දය බී.එස්.පෙරේරා විසින් නිර්මාණය කර තිබීම හා මෙහෙය වීම.
- සුනිල් සාන්ත විසින් එහි ගී තනු නිර්මාණය කර තිබීම.
- මර්සලින් ජයකොඩි පියතුමා ගීත රචනාකර තිබීම.
- ස්වතන්ත්‍ර ගී තනු යෙදීම.
- ඉන්ද්‍රාණි විජේබණ්ඩාර , සිසිර සේනාරත්න හා තිලකසිරි ප්‍රනාන්දු ගීත ගායනයෙන් දායක වීම
- ගී තනු දේශීයත්වයෙන් යුක්ත වීම. (විරිදු - අනුරපුර පොළොන්නරුව....)

WWW.OLEVELAPI.COM

**v. බටහිර සංගීතඥ මොසාර්ට් සංගීතයට සිදුකළ සේවාව.**

- ඔහු විසින් උසස් සංගීත කෘති රාශියක් බිහිකර තිබීම.
- ගීත නාටක හා කොන්චර්ටෝ නමින් හැඳින්වෙන කෘතීන් ඒ අතරින් වඩාත් කැපී පෙනීම.
- වයස අවු: 08 දී ප්‍රථම සංගීත සංධ්වනිය නිර්මාණය කිරීම.
- වයස අවු: 11 දී ප්‍රථම සංගීත ඔරටෝරියෝව නිර්මාණය කිරීම.
- වයස අවු: 12 දී ප්‍රථම සංගීත ඔපෙරාව නිර්මාණය කිරීම.
- වයස අවු: 14 දී ප්‍රථම සංගීත ස්ට්‍රිංට්‍රියෝව නිර්මාණය කිරීම.
- වර්ෂ 1769 දී සැල්ස්බර්ග්වලදී බිෂොප්වරයෙකු යටතේ සංගීත කණ්ඩායම මෙහෙයවන්නෙකු වශයෙන් සේවය කිරීම.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සංගීතඥ මොසාර්ට් විසින් නිර්මාණය කළ සංධ්වනි

- Symphony No – 36 in C Major
- Symphony No – 38 in D Major – Prague
- Symphony No – 39 in E Flat Major
- Symphony No – 40 in G Minor
- Symphony No – 41 in C Major –Jupiter

සංගීතඥ මොසාර්ට් නිර්මාණය කළ ඔපෙරා

- Mithridates, King of Ponts
- Idomeneo, King of Crete
- The Abduction From The Seraglio
- The Marriage of Figaro
- Don Giovanni
- Cosi fan Tutte
- The Magic Flute

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...